ජනමාධ්‍යවේදියකු විසින් පොදුජනතාවට තිබෙන කරුණු දැනගැනීමේ අයිතිය ආරක්ෂා කරන අතරම, සදාචාර සම්පන්න ලෙසින් යම් කිසි සිදුවීමකට අදාළ වන කරුණු නිරවද්‍යව හා අපක්ෂපාතීව වාර්තා කිරීමටද වග බලාගත යුතු වෙයි. එසේම සිය පෞද්ගලිකත්වය වෙනුවෙන් පුද්ගලයෙකුට ඇති අයිතිය එම පුද්ගලයාගේ කැමැත්තෙන් තොරව ආක්‍රමණය කිරීම සාධාරණීකරණය කිරීමට නම් පොදු ජන ලැදියාවට එය අදාළ විය යුතුය.

මව්බිම පුවත්පත මගින් පසුගිය දිනක සමාජ ජාල ඔස්සේද පුළුල්ව කථාබහට ලක්වුණු රිය අනතුරක සිදුවීම වාර්තා කොට ඇති ආකාරය මෙහිදී විමසිල්ලට ගැනීම වටී. මේ සම්බන්ධයෙන් අපගේ පාඨකයින් බොහෝ දෙනෙකු අපගේ අවධානයට සෘජුවම මෙය යොමු කරමින් සමාජ ජාල තුළ සාකච්ඡාවට ගෙන තිබිණි. මෙම ලිපිය ඔස්සේ මව්බිම පුවත්පත සහ එම මාධ්‍යවේදියා විසින් සිදුවීමට අදාළ කරුණු විමර්ශණය කරමින්, විශ්ලේෂණාත්මක වාර්තාකරණයක් සිදුකර ඇතැයි ඔබ සිතන්නේද? එසේත් නැතිනම් මෙය අවම පුද්ගල සදාචාරය හෝ නොතකමින් ලියැවුණු ලිපියක් ලෙසින් මෙය ඔබ නොදකින්නේද? මෙහි දිගින් දිගටම විස්තර කරමින් ලියා ඇති කරුණු මෙම සිදුවීමට කෙතරම් සෘජුව අදාළ වන්නේද? මෙය සැබවින්ම සාකච්ඡාවට ගත යුතුවේ.

#mediaethicsSL #SinhalaPress #SundayMawbima #October6